# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/54 – 2020 මාර්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා – 2020.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 12 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/15/2018/VE/294.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KMB/LAN/ACQUI/2/90.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 04 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, කඹුරුපිටිය.

2. **ඉඩමේ විස්තරය** – දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, කඹුරුපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක MR/KMB/2019/160 හා 2019.05.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම් :

01. **කැබලි අක්ෂර 'A' – රටලංකාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.2317**
උතුරට: ප්‍රගමණ අනුරේඛන අංක MR/KMB/2018/17 හි කැබලි අක්ෂර A , ඒ. ඩී. පියසිරි විසින් හිමිකම් කියන රටලංකාවත්ත, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B, ප්‍රගමණ අනුරේඛන අංක MR/KMB/2018/17 හි කැබලි අක්ෂර A, ඒ. ඩී. පියසිරි විසින් හිමිකම් කියන රටලංකාවත්ත.

02. **කැබලි අක්ෂර 'B' – රටලංකාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.9826**
උතුරට: ප්‍රගමණ අනුරේඛන අංක MR/KMB/2018/17 හි කැබලි අක්ෂර A , මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A , මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ප්‍රගමන අනුරේඛනයේ අංක MR/KMB/2018/17 හි කැබලි අක්ෂර B; නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), ප්‍රගමන අනුරේඛන අංක MR/KMB/2018/17 හි කැබලි අක්ෂර B සහ හිමිකරු සොයාගත නොහැකි පොතුවිල කුඹුර; දකුණට: ප්‍රගමන අනුරේඛනයේ අංක MR/KMB/2018/17 හි කැබලි අක්ෂර B සහ හිමිකරු සොයාගත නොහැකි පොතුවිල කුඹුර;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බටහිරට: හිමිකරු සොයාගත නොහැකි පොතුවිල කුඹුර, ප්‍රගමන අනුරේඛන අංක MR/KMB/2018/17 හි කැබලි අක්ෂර A, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A සහ ඒ. ඩී. පියසිරි විසින් හිමිකම් කියන රටලංකාවත්ත.

03 - 831

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2020 අංක 13 දරන ආඥාව**

මගේ යොමු අංකය: LD/05/2008/L/159.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: MO/DS/LAN/06/01/08.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 04 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, මොනරාගල.

2. **ඉඩමේ විස්තරය** – ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ සුළු කොට්ඨාසයේ, 129 මුප්පනේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුප්පනේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 172 අතිරේක අංක 325 පත්‍ර අංක 366 හා 2013.07.02 දිනැති අවසාන ගම් පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අංක 3547 – මිසියකෙටුමුල්ලෙරොද – ප්‍රමාණය: හෙක්. 2.2333**

උතුරට: කැබලි අංක 1566, 1565 සහ 3549; නැගෙනහිරට: කැබලි අංක 3549 සහ 3548; දකුණට: කැබලි අංක 3549, 3548 සහ 82; බටහිරට: කැබලි අංක 1565, 1566 සහ 3546.

02. **කැබලි අංක 3548 – මිසියකෙටුමුල්ලෙරොද – ප්‍රමාණය: හෙක්. 0.0423**

උතුරට: කැබලි අංක 3547 සහ 3549; නැගෙනහිරට: කැබලි අංක 3549 සහ 3552; දකුණට: කැබලි අංක 3552 සහ 82; බටහිරට: කැබලි අංක 82 සහ 3547.

03. **කැබලි අංක 3550 – මිසියකෙටුමුල්ලෙරොද – ප්‍රමාණය: හෙක්. 0.0317**

උතුරට: කැබලි අංක 3552 සහ 3551; නැගෙනහිරට: කැබලි අංක 3551 සහ 1570; දකුණට: කැබලි අංක 1570 සහ 82; බටහිරට: කැබලි අංක 82 සහ 3552.

03 -832

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.